# සුරාබදු තෑගි අරමුදල - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට සුරාබදු තෑගි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදු සම්මත ගණක මූලධර්මවලට අනුව ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම්, ගැලපීම් සහ පියවීම් සටහන් ඇතුළත් කිරීම සඳහා ප්‍රධාන ජ'නලයක් පවත්වා නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී අපහරණය කරන ලද ඉසුසු ඩබල් කැබ් රථයෙහි රු.60,067 වටිනාකම පොත් වලින් ඉවත් නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) වාහනවලට කැනපි ගැසීම සඳහා වැය කළ රු.652,750 ක් වූ වියදම, ප්‍රාග්ධනිත නොකර 2011 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එය 2012 වර්ෂයේදී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ක්ෂය ප්‍රතිපත්තිය අනුව ලී බඩු හා කාර්යාල උපකරණ සඳහා 2012 වර්ෂය වෙනුවෙන් රු. 869,902 ක ක්ෂය ප්‍රතිපාදනය කළ යුතු වුවත්, වර්ෂයේ ක්ෂය සඳහා රු. 310,762 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය හා සමුච්චිත ක්ෂය ප්‍රතිපාදනය රු. 559,140 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 වන වගන්තිය | දුම්කොළ බදු පනත යටතේ අය කරනු ලබන දඩ මුදලින් සියයට 25 ක් තෑගි මුදල් ගෙවීමට හිමිකම් ලබන අතර, ඒ සඳහා පනතේ 17 (ii) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් යෝජනා කරන ක්‍රමයක් අනුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ පාලනය යටතේ පවතින තෑගි අරමුදලක් ස්ථාපිත කර ගත යුතු වුවද, එවැනි අරමුදලක් 2013 ඔක්තෝබර් 31 දින වන විටත් ඇති කර නොතිබුණි. |
| (ආ) මු. රෙ. 756 | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 22,882,912 ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳව භෞතික සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) 2009 සැප්තැම්බර් 01 දිනැති අංක ඩීඑම්ඒ/2009/02 දරන කළමනාකරණ | සුරාබදු තෑගි අරමුදල යටතේ මිළදී ගන්නා ලද වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් |

විගණන වකුලේඛය ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් රු. 19,769,754 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. 17,245,710 ක ශුද්ධ අතිරික්තයක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,524,044 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී අරමුදලේ සමස්ථ ලැබීම් රු. 7,990,488 ක් හෙවත් සියයට 8 ක් වැඩි වී තිබීම අතිරික්තයේ වැඩිවීමට මූලිකව බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 4,793 ක් තුළින් රු.99,161,671 ක ආදායමක් උපයා තිබූ අතර, ඉකුත් වර්ෂයේදී කාර්මික අපරාධ 4,597 ක් තුළින් රු.93,344,983 ක ආදායමක් උපයා තිබුණි.

(ආ) 2011 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්මික අපරාධ සමස්ථ ආදායම රු.5,816,688 ක් හෙවත් සියයට 6.2 ක්ද දුම්කොල බදු අපරාධ සමස්ථ ආදායම රු.2,173,800 ක් හෙවත් සියයට 60 කද වැඩිවිමක් පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය ලේඛනමය පාලනය

ක්‍රීඩා විනෝද හා සුභසාධක වැඩවලට රු. 50,000 ක්ද, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් කළ යුතු ක්‍රියාවලට රු. 200,000 ක්ද වෙන්කර තිබුණද, මෙම සම්පූර්ණ මුදල් ප්‍රමාණයන් වැය නොකර ඉතිරිව පැවතුණි. 1994 මාර්තු 04 දිනැති අංක. 818 දරන සුරාබදු නිවේදනයේ 4.5 වගන්තිය ප්‍රකාරව, ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීමක් කළ යුතු වෙනත් ක්‍රියාවලට තෑගි මුදලින් ගෙවීමේ ක්‍රමවේදය 2013 ඔක්තෝබර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 සංයුක්ත සැලැස්ම

අරමුදලේ දර්ශනය සහ මෙහෙවර ඉටු කර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) දුම්කොළ බදු පනත යටතේ වූ තෑගි අරමුදල ස්ථාපනය කිරීම

(ඇ) වත්කම් පාලනය